සුබස් සිතිවිල අදහස් අනුවලි

වි ක ධර්මබන්ධු

මම අද උගත් පඬිවරුන්ගේත්, බාසා විසාරදයන්ගේත් පත පොත කියවන්නේ එක්තරා අරමුනක් - විශේශ හේතුවක් ඇතිවය. මා න/ණ,ල/ළ, ශ/ෂ වෙනස නොසලකා ලියන්නේ ඇය් ද යන්නට හේතු සාදක සොයා ගැනීම ඒ හේතුවය. මා අද ඒ සඳහා තෝරා ගත්තේ කොළඹ සරසවියේ සිංහල අංශයේ "ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය" කෝපරහේවා සඳගොමීන් විසින් ලියන ලද "සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය" නම් පොතය. මහ වෙහෙසක් දරා ඔවුන් විසින් ලියන ලද ඒ පොත, න/ණ - ල/ළ - ශ/ෂ වෙනසත් අල්පප්‍රාණ - මහාප්‍රාණ වෙනසත් තේරුම් ගැනීමට - ඉගෙනීමට දුහුනන්ට මහත් පිටිවහලකි. පහලොස් වැනි වියේ සිට මේ වනතෙක් නිවැරදි සේ මා සලකන (වසර කීපයක සිට වෙනස් මගක යන) තැන් කීපයක් මෙහි දක්වන්නේ, කිසියම් විසාරදයකු මගේ මතයේ දොසක් දක්වතොත් එය ගරුවෙන් පිලි ගැනීමට සූදානම් බව කියමිනි.

සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය

1. පිටුව / අක්යා ළ : ගොයම් කැපීමේ දී දෙවියන් උදෙසා වෙන් කරනු ලබන කොටස "අක්යාළ් වී" යනුවෙන් හැඳින්වෙන බව කියති. එතැන ඇත්ත් දන්තප "ල්" ය. වෙනත් "අක්යාළක්" ගැන මා අසා නැත.

අගුල් / අගුළු දෙකම දක්වා ඇත. දොර අගුල් / අගුල්ලනවා, කන අගුල් / අගුල් වැටිලා යන වියහර අපට හුරුය. අපි කිසි විටෙක "අගුළු" බාවිතා නොකරමු.

අග්ගළා : අතින් හැදු ගලක් වැනි කැවිලක් අත් + ගල - අග්ගල - අග්ගලා වී ඇත්නම් "අග්ගළා" වැරදිය.

2. පිටුව / අටසාලිස් : හතළිස් අට පද පෙරලියෙන් අට සතළිස් වේ. එය අනතුරුව "සත් + අ + ලිස් - ස + අ + ළිස් (ත් ලොප් වී) = සාළිස් වේ. එ සේ නම් "සාළිස්" වැරදි ය.

6. පිටුව / අරුණාලෝකය = අරුණු + අලු = අරුණලු 15. පිටුව / එළිය - "ආලෝකය" එක්තැනක "අලු" යනුවෙනුත් තවත් තැනක "එළි" යනුවෙනුත් යෙදෙන්නේ ඇය්. "අලු" අනම්‍යාදේශයෙන් "ඇළි" වී අනතුරුව "එළි" වෙතැය් සිතමි. මහන - මැහැනි - මෙහෙනි; මනවු - මැහැවි - මෙනෙවි; වන - වැනි - වෙනි යන පදවල "ඇ" යන්න "එ" වන රීතිය මෙතන ද ඇතැ ය් සිතමි. බොහෝ දෙනා ලියන නිසා මොවුන් ද "එළිය" නිවැරදි ලෙස සිතන බව පෙනේ.

7. පිටුව / අවුළනවා (ඇගිළිනවා) 8 පිටුව / අහුළනවා. එක් ම වචනය දෙපලේම ඇත. "හ" යන්න "ව" යන්නට මාරුවීම සිය බසේ රීතියකි. ගිරාහු - ගිරවු - ගිරව් ; කියහු - කියවු - කියව්; ඔහුහු - ඔවුහු - ඔව්හු වන්නේ ඒ රීතිය අනුවය්. අහුළනවා හරිනම් අවුළනවා වැරදිය; අවුළනවා හරිනම් අහුළනවා වැරදිය. "වූ" යන්න කලාතුරකින් මට කියවෙන්නේ. එහෙයින් "උ" සොරය ලොප් කොට මම "අව්ලනවා" ලියමි. "යි" යන්න ද මට කියවෙන්නේ කලාතුරකිනි. යීස්(ව) යන ඉංගිරිසි වචනය ඇරෙන්නට යි/යී යන අකුරකින් පටන් ගන්නා වෙනත් වචනයක් මම නොදනිමි. ඇය් + ඉ = ඇයි, කොය් + ඉ = කොයි, එය් + ඉ = එයි, නය් + ඉ = නයි, අය් + ඉ + යා = අයියා මය් + ඉ + නා = මයිනා යන වචනවල ඇති "ඉ" යන්න කිසි විට මට නොකියවේ. බලත් - බලය් යන දොන "ල" යන්න විවෘත හඬින් කියවේ. එසේ වන්නේ ඊට ඉදිරියෙන් ඇති හල් අකුරු නිසා ය. ඒ අනුව කියය්, කපය්, කසය්, ගලය්, ගසය් ආදි පදවල "ය්" යන්නට මුලින් ඇති "අ" ස්වරය විවෘතව කියවෙන හැටි බලන්න.

එසේම කපත්/කපති, කසත්/කසති, ගසත්/ගසති, පලත්/පලති, මසත්/මසති යන පදවල මැද අකුර දෙවිදියකට (විවෘත ව හා සංවෘත ව) කියවෙන සැටි ද බලන්න. හල් (අකුරට) "ත්" යන්නට මුලින් ඇති "අ" යන්න විවෘත ව කියවේ. (ඉ) "ති යන්නට මුලින් ඇති "අ" යන්න සංවෘත ව කියවේ. බලයින්, ලමයින්, ගවයින් නරයින්, සමනලයින් ආදී තැන්වල "යි" යන්නට මුලින් අති "අ" ස්වරය සංවෘත ව කියවෙන සැටි ද තේරුම් ගන්න. එසේ සංවෘත "අ" යන්න කියවෙන්නේ ඉදිරියෙන් "ය්" (හල් අකුරක්) නැති නිසා ය. පදයක අග ඇති යි/වු අකුරු දෙක කියවෙන්නේත් ය්/ව් (ලමය් - නය්/ගිරව් - පරව්) යනුවෙනි.

8. පිටුව / ඇණ - (යකඩ ඇණ - පිත්තල ඇණ, ඇන (අතිනවා පූ. ක්‍රියා) ඇන කොටා ගන්නවා නිවැරදිය. එහෙත්, ඇන තියා ගන්නවා - ඇන හිටිනවා යන තැන්වල ඇත්තේ ඇණ ගස් පු කලක මෙන් නොසැලී සිටීමය්; නැවතී සිටීමය්. "මොකද උඹ ඔතන ඇණ ගහපුව: වගේ ඉන්නේ ?" යන වැකිය තේරුම් ගත් විට, ඇන තියා ගන්නවා - ඇන තියා ගෙන ඉන්නවා - මැසිම ඇන හිටලා - මෝලේ වැඩ ඇන හිටලා යන තැන්වල ලිවිය යුත්තේ දන්තජ ඇන නොව මුර්ධජ ඇණ ය්.

11. පිටුව / ඉකිළිය, 22. පිටුව/ කිහිලි (කිහිල්ල). ඉකිල්ලේ ගෙඩියක්, කිහිල්ලෙත් ගෙඩියක් - ඉකිල්ල රිදෙනවා, කිහිල්ලත් රිදෙනවා - ඉකිල්ලටත් උඩිං වතුර ගලලා වැනි යෙදුම් ගැන හිතන විට "ඉකිළිය" නිවැරදි ද යන සැකය ඇති වේ.

2. පිටුව / අතුල්ලනවා 14 පිටුව/ උළනවා - අත් + ලනවා, අල්ලනවා, අත් + උළනවා = අතුල්ලනවා නිවැරදි නම් "උළනවා" යන්නේ ඇත්තේ මූර්ධජ "ළ" යන්න නොවේ.

12. පිටුව / උගුළනවා - උගුළුවනවා - උගුලනවා / උගුල්ලනවා, ඉගිලුවා / ඉගිල්ලුවා, ඉගිලුනා / ඉගිල්ලුනා යනුවෙන් සාමාන්‍ය වියහරේ ඇති වචන අමතක කල යුතු නැත.

17. පිටුව / කන් සිළ (සිදුර) කතා බහේ ඇසෙන හිලත්, සිලත් එකක් යය් සිතමි. කලේ හිල් වෙලා - වහලෙ හිල් හැදිලා හිල් අස්සෙං අහස පේනවා: යන වියහර ගැන සිතන විට සිල /හිල නිවැරදි යය් සිතේ.

19. පිටුව / කලවිට - "දාවිත් ගොයං කොළේට මුවා වෙලඃ ජේමිස්ට ගිනි බින්ද:" මේ සාක්කිය නිසා දාවිත් නිදහස් විය. මිනිසෙකුට ගොයං කොලයකට මුවා වී ගිනි බිඳිය නොහැකි බව උසාවියේ තීරනය විය. ගොයං කොලේ යනු ගොයං මිටි කැටියය්; මුනින් නැමූ පොල් කටුවක හැඩයට අඩි පහක් හයක් උසට හදන ගොයම් කොල කැටියය්. රත්නපුර පලාතේ ඇති "කලවිටිගොඩ" ගම ගැන මම දනිමි. කලවිටිගොඩගේ යනුවෙන් පෙලපත් නමක් ද ඇත. ගොයං කොළේ - කොළ කැටිය - කොළවිට කොළ පාගනවා කමත් බස හා බැඳි වචනය්.

එහෙයින් "කලවිට" වැරදිය. කලවැද්දා ගැනද කිව යුත්තේ එයය්. කොළ වැද්දා ම කළවැද්දා වී ඇති නිසා එතනට මූර්ධජ "ළ" යන්න ලිවිය යුතුය. "ඔ" යන්න වෙනුවට "අ" යන්නත් "අ" යන්න වෙනුවට "ඔ" යන්නත් පැමිනීම සිය බසේ රීතියකි. කොන/කන (අලියාට ඇද ගෙන යෑමට සකස් කරන ලද ලී කොටයක කොන) බිතක්කන දොර / දර - ගිරිදර, ගින්දර දොළ / දළ - කිරිවන් දළ, පිළියන්දළ, පෝද්දළ (පුවක් දොළ) පළ / පොළ - ගම්පොළ, කඩපොළ, පන / පොන - කිරිලිපොන මාරපොන, පත/පොත - නිකදලුපොත, දලුපොත

19. පිටුව / කලාදුරු - අලයේ කලු පැහැය ගැන සිතන විට කළාදුරු නිවැරදි යය් සිතේ.

25. පිටුව / කොරළ / කොරලි, අපේ වියරන පොත්වල නැති තද්දිත ප්‍රත්‍ය දෙකක් ඇති බව පෙනේ. ර සහ ළ දෙකය් ඒ. දිය + ර = දියර, කුස + ර = කුහර, වස + ර = වසර එකකි. අඩ + ළ = අඩළ, කොර + ළ = කොරළ අනෙකය්. (නාකන්ද + ළ = නාකන්ළ, ආරච්චි +ළ = ආරච්චිළ ගැනද හිතන්න). මා නිවැරදි නම් " කොරළ" වැරදිය. කොරළ + ඉ = කොරලි වන නිසා එය නිවැරදිය.

21. පිටුව / කැලැන්ඩරය ට, ඩ දෙකඩ පෙර ව ලිවිය යුත්තේ "ණ" ය. ඒ රීතිය වෙනස් කරන්නේ කවර නීතියකට අනුව ද ? මා න/ණ, ල/ළ නොසලකන නිසා මට එය අදාළ නැත. එහෙත් න/ණ, ල/ළ රකින්නන් ට කවර හේතුවක් නිසාවත් එයට අවසර නැත. දණ්ඩ - පණ්ඩිත, ගණ්ඩි - කණ්ඩ ලියන අයට සිලිණ්ඩරය - කවුණ්ටරය - ලණ්ඩන් - පැණ්ඩා ලියන්නට බැරි අසනීපය කුමක්ද?

ඉතිරි කොටස ලබන සඟරාවේ

විජය පුවත රාජාවලියෙන් ... 2

"එපවත් වගුරජ අසා සෙනඟ රැස් කරවා සිංහයා විද හෙළා අල්ලන්ඩ කී හ. සිංහයා උන් වනාන්තරය වට කර බලන විට සිංහයා නාද කර පැනපු විට සෙනඟ බය වැද බිඳී දසඅත ගියාහ. සමහරුන් අල්ල මා දැමීය. ආපසු සෙනඟ ඇවිත් රජහට කී විට රජ කියන්නේ සිංහයා මැරූ යම් පුරුෂයෙක් ඇත්නම් ඔහුට රාජ්‍යයෙන් පළාතක් දෙනව යි කියා නුවර මුළුල්ල බෙර ලැවූ හ. (ඒ රජුට බල සේනාවක් නොතිබිනි ද?) තුන් වරක් බෙර ලූ විට සිංහයාගේ පුත් බෙර නවතා සිංහයා විදින්ඩ දුනු හී ගෙන ගොසින් සිංහයා උන් වනයට වැද වරෙයි කියා අඬ ගැසූ විට පුතාගේ කට හඬ අසා අමාපැන් කණ වක්කළාක් මෙන් දිව ගෙන ඇවිත් සිංහබා කුමරු දකලා හීය විදින විට මුණ කරකැවී වැටුණා හ. දෙවනු තුන් වෙනු ද හීය මුණ කරකැවී වැටුණා හ. හතරවෙනි හීය දැතිවර (දෑතින් වෙර) ලා පු විට මා මරන්ඩ යයි සිතා සිංහරජ කිපී කා දමම් රොස් ව බැලූ විට ඒ සැරය කෙසරිඳුගේ නළලත වැද බිම වැටී විලාප කියමින් පුතණුවන් ළඟට කැඳවා හිස උකුලේ තබා මවු හා දෝණියන් මතක් කළ බව කියන්ඩ කියා මළේය. එවිට සංහබා කුමරු සිංහයාගේ හිස කපාගෙන ඇවිත් රජුට දිලා සිටි විට ලාඩ දේශයේ සිංහබා පුර නුවර කරවා සිංහවල්ලි කුමරිය අග බිසෝ කොට සිංහබා කුමාරයාට ජාතක කර සොළොස් වාරයෙක නිමුනු දරුවන් දෙතිස් දෙන්නෙකු වැදුවාහ.

(මෙය පොතේ ඇති සැටියට ම ලියූවකි. අක්ෂර වින්‍යාසය, උක්තාක්‍යාත සම්බන්ධය, දරුවන් දෙතිස් දෙන්නකු (දෙතිස් දෙකකු හෝ තිස් දෙන්නකු විය යුතුය) යන තැන් තේරුම් ගන්න)

පිටපත් කෙලේ වි.ක. ධර්මබන්ධු

DELIVERY DRIVERS NEED

Courier drivers need for permanent runs start from Port Melbourne at 6.30am and finished around 4.00pm in Port Melbourne. Vans provided and immediately start. Guaranteed good income per week.

Send your resume to dandytransport@yahoo.com.au